# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2282/56 - 2022 ජුනි මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2022.06.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : KDS/PHT/4/6/1/11.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2018/WS/465.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 986 දරන පින්නගොල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බූටාවත්ත ගමේ පිහිටි, සර්වේයර් ජෙනරාල් වෙනුවෙන් මහනුවර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් මැන සකස් කරවා, 2022.02.24 දිනැතිව අනුමත කරන ලද අංක මහ 7155 දරන මූලික පිඹුරේ, කැබලි අංක 1, 2 හා 3 වශයෙන් දැක්වෙන, කිරිබෝව හා පින්නගොල්ල නමැති ඉඩම් කොටස් වලින් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0486 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් තුන:

1. **කැබලි අංක 01 - කිරිබෝව- එච්.ජී.සෝමරත්න මහතා, අංක C/A/7/13, රන්පොකුණ ගම, නිට්ටඹුව සහ තවත් අය - ප්‍රමාණය හෙක්. 0.0041 (පර්චස් 1.6)**

*උතුරට*: එච්.ජී.සෝමරත්න හා තවත් අය හිමිකම් කියන කිරිබෝව සහ මාර්ගය; *නැගෙනහිරට*: අංක මහ 2432 දරන මූලික පිඹුරේ කැබලි අංක 62; *දකුණට*: අංක මහ 2432 දරන මූලික පිඹුරේ කැබලි අංක 62; *බටහිරට*: එච්.ජී.සෝමරත්න හා තවත් අය හිමිකම් කියන කිරිබෝව.

2. **කැබලි අංක 02 - පින්නගොල්ල- එච්.ඒ.සිසිර හෙට්ටිආරච්චි මහතා, අංක 37, පින්නගොල්ල, තලාතුඔය - ප්‍රමාණය හෙක්. 0.0192 (පර්චස් 7.6)**

*උතුරට*: අංක මහ 2436 දරන මූලික පිඹුරේ කැබලි අංක 63; *නැගෙනහිරට*: අංක මහ 6857 දරන මූලික පිඹුරේ කැබලි අංක 1; *දකුණට*: අංක මහ 2436 දරන මූලික පිඹුරේ කැබලි අංක 61; *බටහිරට*: අංක මහ 2436 දරන මූලික පිඹුරේ කැබලි අංක 62.

3. **කැබලි අංක 03 - කිරිබෝව - කේ. ධනරාජ් මහතා, කිරිබෝව, තලාතුඔය - ප්‍රමාණය හෙක්. 0.0253 (පර්චස් 10)**

*උතුරට*: කේ. ධනරාජ් හිමිකම් කියන කිරිබෝව; *නැගෙනහිරට*: කේ. ධනරාජ් හිමිකම් කියන කිරිබෝව; *දකුණට*: එම්.ජී.ප්‍රේමරත්න හිමිකම් කියන දානේවත්ත; *බටහිරට*: අංක මහ 6857 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 සහ අංක මහ 2436 දරන මූලික පිඹුරේ කැබලි අංක 63.

1A - G 36875 - 17 (2022/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 ජූලි මස 28 වැනි දින පෙ.ව. 10.00 ට පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 ජූලි මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එච්.කේ.සාගරිකා දිල්හානි,
ප්‍රාදේශීය ලේකම්,
පාතහේවාහැට.

2022 මැයි මස 27 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0033

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ, 7 වන වගන්තිය යටතේ පළකරන ලද අංක 2278/08 දරන 2022 මැයි මස 04 වන බදාදා දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශුද්ධි පත්‍රිකාවේ සම්මුඛ පරීක්ෂණ දිනය හා වේලාව 2022.06.23 දින පෙ.ව 9.00 ලෙසත්, අයිතිවාසිකම්වල ස්වභාවය ලබා ගැනීමේ දිනය 2022.06.16 ලෙසත් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්.එම්.උපේක්ෂා කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
කන්තලේ.

2022.06.02 වැනි දින.

EOG 06 - 0035

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.